# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

අංක. 9,917—1948ක්වූ නොවැම්බර් මස 5 වෙනි දිනවූ සිකුරාදා.


## PART IV.—හතරවෙනි කාණ්ඩය.

### උපාංග නීති.

L. D.—B. 70/48

L. G. D.—B. B. 1135.

#### බල්ලන් ලියාපදිංචිකිරීමේ ආඥාපනත.

වත්තල-මාබෝලෙ-පෑලියගොඩ නගරබද සභාවේ පාලන බලය පවත්නා සීමා ඇතුළත ප්‍රදේශයට බල්ලන් ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (334 වැනි පරිච්ඡේදය) 4 වැනි වගන්තිය යටතේ අතුරු ව්‍යවස්ථා සම්පාදනයකිරීමට බලයලත් නියම් නිලධාරියා විසින් එනම්, වත්තල-මාබෝලෙ-පෑලියගොඩ නගරබද සභාවේ ප්‍රධානතුමා විසින් එකී ප්‍රදේශය වෙනුවෙන් සම්පාදිත අතුරු ව්‍යවස්ථා.

බී මින්සෙන්ට් ජයවර්ධන,
ප්‍රධානතැන.

මේ 1948ක්වූ ඔක්තෝබර් මස 26 වැනි දින
වත්තල-මාබෝලෙ-පෑලියගොඩ සභා කාර්යාලයේදීය.

#### අතුරු ව්‍යවස්ථා.

1. මේ අතුරු ව්‍යවස්ථාවන්හි—

"ප්‍රධානතුමා" යනුවෙන් වත්තල-මාබෝලෙ-පෑලියගොඩ නගර සභාවේ ප්‍රධානතුමාද,

"අවුරුදුපතා ලියාපදිංචිකිරීමේ ගාස්තුව" යනුයෙන් ආඥාපනතේ 4 වැනි වගන්තිය යටතේ අයකළයුතු අවුරුදුපතා ලියාපදිංචිකිරීමේ ගාස්තුවද,

බල්ලකු සම්බන්ධයෙන් "අයිතිකාරයා" යනුයෙන් ඒ බල්ලා භාරව හෝ අයිතිකරගෙන හෝ සිටින අයද,

අදහස්කරනු ලැබේ.

2. (1) වයස 6 මසකට වැඩිවූ යම් බල්ලකු තබාගන්න සිටින ගෙයක හෝ ස්ථානයක හෝ පදිංචිකාරයා විසින් එක් එක් අවුරුද්දේ මාර්තු මස 1වෙනිදා හෝ ඊට ප්‍රථමයෙන් ප්‍රධානතුමා වෙත මීට යාකොට ඇති උප ලේඛනයේ තිබෙන පෝරමයේ ප්‍රකාර වාර්තාවක් සැපැයිය යුතුයි.

(2) යම් අවුරුද්දක මාර්තු මස 1වෙනිදසින් පසු යම් අයකු විසින් යම් ගෙයක හෝ ස්ථානයක හෝ බල්ලකු තබාගැනීමට පටන්ගත් විට ඒ ගෙයි හෝ ස්ථානයේ හෝ පදිංචිකාරයා විසින් ප්‍රධානතුමා වෙත මීට යාකොට ඇති උප ලේඛනයේ තිබෙන පෝරමයේ ප්‍රකාර වැඩිපුර වාර්තාවක් වහාම සැපැයිය යුතුයි.

3. එක් එක් බල්ලාගේ අයිතිකාරයා විසින් අවුරුදුපතා ලියාපදිංචිකිරීමේ ගාස්තුව—

(a) 2 (1) වැනි අතුරු ව්‍යවස්ථා යටතේ වාර්තාවක් සපයනලද බල්ලකු සම්බන්ධයෙන්වූ විට ගාස්තුව අයවිය යුතු අවුරුද්දේ අප්‍රේල් මස 1වෙනිදා හෝ ඊට ප්‍රථමයෙන්; හෝ

(b) 2 (2) වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ වැඩිපුර වාර්තාවක් සපයනලද බල්ලකු සම්බන්ධයෙන්වූ විට ඒ වැඩිපුර වාර්තාව සපයනලද දිනයෙහි සිට පසළොස් දිනක් ඇතුළතදී;

ගෙවිය යුතුයි.

4. අවුරුදුපතා ලියාපදිංචිකිරීමේ ගාස්තුව ගෙවූ විට ප්‍රධානතුමා විසින් බල්ලා අයිතිකාරයාට—

(i.) ලියාපදිංචිකිරීමේ සහතිකපත්‍රයක්, හා

(ii.) සහතිකපත්‍රයේ අංකය සහ ඇති ටිකැට් තහඩුවක් හෝ කර පටියක්,

නිකුත්කළ යුතුයි.

එසේත් ප්‍රධානතුමා විසින් ලියාපදිංචිකිරීම සඳහා ඉල්ලීමක් කළ ඔනෑම් බල්ලකු පෙන්නා සිටීමට නියමකිරීමත්;

(a) ඒ බල්ලා පෙන්නා නොසිටියහොත් හෝ, හෝ

(b) ප්‍රධානතුමාගේ කල්පනාවේ හැටියට ඒ බල්ලා ජීවත්ව සිටීමට නුසුදුසු ලෙස අබ්බගාතයෙන් පෙළෙන්නාවූ හෝ රෝග සහිතවූ හෝ වෙනත් බල්ලන්ට බෝවිය හැකි යම් රෝගයකින් පෙළෙන්නාවූ සතෙක්වේ නම්, හෝ

(c) අයිතිකාරයා විසින් ඒ බල්ලාව නිතරම සිරිතක් ලෙස හිංසාකරනු ලැබේ නම් නැතහොත් ඌනව නොසලකා හරිනු ලැබේ නම්;

ලියාපදිංචිකිරීමේ සහතිකපත්‍රයක් හා ටිකැට් තහඩුවක් හෝ කරපටියක් ඒ බල්ලා වෙනුවෙන් නිකුත්කිරීම ප්‍රතික්ෂේප කිරීමත්, කළ හැකියි.

5. ලියාපදිංචිකිරීමේ සහතිකපත්‍රයක් නිකුත්කර තිබෙන යම් බල්ලකුගේ අයිතිකාරයාගේ පදිංචි ස්ථානයෙහි දැන්වීමක් (නොතීසියක්) තබන්නට සැර අවාව පසු ප්‍රධානතුමා විසින් ඒ සහතිකපත්‍රය.—

(a) ප්‍රධානතුමාගේ කල්පනාවේ හැටියට ඒ බල්ලා ජීවත්ව සිටීමට නුසුදුසුලෙස අබ්බගාතව හෝ රෝග සහිතව සිටී නම්, හෝ

(b) අයිතිකාරයා විසින් ඒ බල්ලාව සිරිතක් ලෙස නිතරම හිංසාකරනු ලැබේ නම් නැතහොත් ඌනව නොසලකා හරිනු ලැබේ නම්, හෝ

(c) ඒ බල්ලා වාතයෙන් හෝ ස්පර්ශයෙන් බෝවෙන රෝගයකින් පෙළෙමින් සිටියදී අයිතිකාරයා විසින් ඌනව වෙන යම් බල්ලකු සමග එකට හැසිරීමට අවකාශ දෙනු ලැබේ නම්, හෝ

(d) ඒ බල්ලා ටිකැට් තහඩුවක් හෝ කරපටියක් නැතුව දඩාවතේ යන බැව් දකින්නට ලැබේ නම්,

අවලංගුකළ හැකියි.

6. (1) 4වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ ලියාපදිංචිකිරීමේ සහතිකපත්‍රයක් දීම ප්‍රතික්ෂේපකර ඇත්නාවූ හෝ 5 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ ඒ සහතිකපත්‍රය අවලංගුකර ඇත්නාවූ හෝ යම් බල්ලකුගේ අයිතිකාරයා විසින් තමාට ඒ සම්බන්ධයෙන් ප්‍රධානතුමා විසින් දැන්වීමක් (නොතීසියක්) භාරකරවූවිට ඒ දැන්වීමෙහි සඳහන් වන්නාවූ වේලාවේදීත් ස්ථානයේදීත් ඒ බල්ලා ගෙනවුත් පෙන්නාසිටිය යුතුයි.

(2) ප්‍රධානතුමාට සුදුසුයැයි කල්පනාවන හැටියෙකින් එවැනි සෑම බල්ලකුම විනාශකිරීම හෝ ඌනට වෙන යම් සුදුසක් හෝ කළ හැකියි.

7. ටිකැට් තහඩුවක් හෝ කරපටියක් හෝ නිකුත්කර ඇති කවර බල්ලකුගේ වුවද අයිතිකාරයා විසින් ඒ බල්ලා සම්බන්ධයෙන් නිකුත්කරනලද ලියාපදිංචිකිරීමේ සහතිකපත්‍රය වලංගුව පවතින කාලය තුළ සෑම විටකම ඒ බල්ලාගේ කරේ ඒ ටිකැට් තහඩුව හෝ කරපටිය සහ් ගෙනාදින් සවිකොට තිබෙන බැව් දැක්මට වුවමනා සෑම ආන්දම්නම් ක්‍රියාකළ යුතුයි.

8. මේ අතුරු ව්‍යවස්ථාවලින් ප්‍රධානතුමා කෙරෙහි පවරන ලද බලවලින් කිසිවක් හෝ සියල්ලම පාවිච්චිකිරීමට ප්‍රධානතුමා විසින් යම් අයකුට ලියවිල්ලකින් බලය පැවරිය හැකියි.

9. අංක 8,618 හා 1940 මැයි මස 31වැනි දින දරන ගැසට් පත්‍රයෙහි පළවූ කොළඹ දිස්ත්‍රික්කයට අයත් සමහර සැනටරි බෝර්ඩ් නගරයන් විසින් සකස්කරනලද වර්‍ෂ 1939 අංක 61 දරන නගරබද පළාත් සහා ආඥාපනතේ 246වෙනි වගන්තිය යටතේ වත්තල-මාබෝලෙ-පෑලියගොඩ පාලන සීමාව තුළ බලපාමින් තිබිය බල්ලන් ලියාපදිංචිකිරම පිළිබඳවූ අතුරු ව්‍යවස්ථාව මෙයින් අවලංගුකරනු ලැබේ.

උප ලේඛනය.

පෝර්මය.

අංකය :——.

19—මාර්තු මස 1වැනිදා හෝ ඊට ප්‍රථමයෙන් හෝ සම්පූර්ණ කොට ප්‍රධානතුමා වෙත ආපසු යැවියයුතු වාර්තාවයි.

ගෙයි අංකය : ——.

වීදියේ අංකය :——.

ගමේ නම :——.

වත්තේ නම :——.

ගෘහමූලිකයාගේ නම :——.

| තවාලෙහි සිටින බලල්ලන්ගේ ගණන | විස්තරය | | | | මෙසත් කරනු | අතිකාරයේ සිය | ලබන අප්‍රේල් මස 1වෙදා හෝ ඊට ප්‍රථමයෙන් ගෙවීමේ දිනය |
|---|---|---|---|---|---|---|---|
| | බලීස | ගැණු සතුන්, ඔසරි පිරිමි සතුන් | පාට | මෙල්ලේ මසු | | | |
| | | | | | | | |

භාරදුන් දිනය : 19 ——.

——

ගෘහමූලිකයාගේ අත්සන.

——

භාරදෙන අයගේ අත්සන.

සැලකිය යුතුයි.—නියමිත දිනදී හෝ ඊට ප්‍රථමයෙන් මේ වාර්තාව සම්පූර්ණකොට ආපසු නොයැවීම ගැන දඬුවම්වශයෙන් රුපියල් 20කට වැඩිනැති දඩයක් ගැසිය හැකිසි.

---

## ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම්.

ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—උඩුනුවර ආණ්ඩුවේ දෙමළ පාසැලක් තැනීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "203 පරිච්ඡේදයේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" පස්වෙනි කාණ්ඩයේ සාරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට ඉඩම් සහ ගොවිකර්මාන්ත පිළිබඳ ඇමතිතුමාගෙන් නිසිආකාර බව අණ ලැබී තිබේ, ඒ ඉඩම නම්:—

සිතියමේ නො. P. P. A 1,243. ගම—මාතාබොඩ.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | මාරුකොනවත්ත .. | අවුරුදු 50ක්වූ රබර්ගස් 249ක් .. | ජේ. ඇල්. දෙවරල්, ආර්. ඇfජ්. බේfපම්, මිසිස් ආර්. සී. රෙර්දේ, මාරුකොනවත්ත, උඩුවෙල | 1 3 36·5 |

එබැවින් ඉඩම අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හයවෙනි වගන්තියේ හිනෑසාර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම හෝ කොයි තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්‍ෂ 1948ක්වූ නොවැම්බර් මස 29වෙනි දින පස්වරු 2.30ට කයිසමට මාතලේ කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා ප්‍රකාශකිරීමට ඕනෑවා සහ මේ ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියා සිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්‍ෂ 1948ක්වූ නොවැම්බර් මස 2වෙනි දින මාතලේ කච්චේරියේදීය.

එච්. ඇස්. අමරසිංහ,
ආණ්ඩුවේ උප ඒජන්ත වර්‍යා.

——

ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—තීදියගම ගොවිකම් කමිටුවට ලිඳක් සෑදීම සඳහා මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැණීම සඳහා ක්‍රියාකරන පිණිස "203 පරිච්ඡේදයේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" 5වෙනි කාණ්ඩයේ සාරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට, උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර බව අණ ලැබී තිබේ, ඒ ඉඩම නම්:—

අතුරු සිතියමේ නො. 5 සිට සිතියමේ නො. 564. ගම—ගොඩකොග්ගල.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 23 | කොග්ගලබැද්ද .. | ගේන, සීරගෙයක් සහ බඳුමෙන් සාදපු ලිඳක් | ඊ. ජ්. විජයසිංහ, මාතර, කෙත්තකෝත්ගමගේ සිරිඅප්පු, වළව, බරුකැමමුහන්දිරම්ගේ අන්දෙුදි, සව්දියස් සභාපති, උඩබැරගමගමගේ ගේසාන, ජයසේකරගජනින්තමගේ දෙදත් අන්දිරීස්, කොග්ගල්ල; ජයසේකරගජනින්නමගේ රතනා, බැරගම, කෙත්තකෝත්ගමගේ රතනා, බැරගම, මාතමිකත්තු විදුනආරච්චිගේ පැලිස්, දෙවිනුවර | 0 3 18 |

එබැවින් ඉඩම අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා 6වෙනි වගන්තියේ හිනෑසාර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම හෝ කොයි තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්‍ෂ 1948ක්වූ දෙසැම්බර් මස 4වෙනි දින අ. භා. 2.30ට අම්බලන්තොට කාර්‍යාලයේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්‍ෂ 1948ක්වූ නොවැම්බර් මස 2වෙනි දින හම්බන්තොට කච්චේරියේදීය.

ඩී. ජී. දයාරත්න,
ආණ්ඩුවේ උප ඒජන්ත වර්‍යා.

——

ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—පච්චයිගමනිහිති පටපන්නුවන් ඇතිකිරීමේ ව්‍යාපාරය පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "ආණ්ඩුවට ඉඩම් ලබාගැණීමේ ව්‍යවස්ථාවේ" 5වෙනි කාණ්ඩයේ සාරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට ගොවිකම් සහ ඉඩම් පිළිබඳ ඇමතිතුමාගෙන් නිසිආකාර බව අණ ලැබී තිබේ, ඒ ඉඩම නම්:—

සිතියමේ නො. A. 1,535. ගම—පච්චයිගමයි.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | සඳබල්ලයි .. | මුඩුබිම (ගල් සහිතයි) .. | .. ඇස්. රත්නනාදර්, හැපැල් පෙට්ටිය නො. 305, කොළඹ | 0 2 3 |
| 2 | සඳබල්ලයි නොහොත් කුරුම්බිපුලම් | (ගොවිතැන් නොමැති) බැම්මෙන් බැඳපු ලිං දෙකක් අඩංගු වත්ත | එම .. | .. 11 2 10 |

එබැවින් ඉඩම් අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා 6වෙනි වගන්තියේ හිනෑසාර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම හෝ කොයි තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්‍ෂ 1948ක්වූ නොවැම්බර් මස 26වෙනි දින උදේ 10ට කයිසමට යාපනේ කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්‍ෂ 1948ක්වූ ඔක්තෝබර් මස 28වෙනි දින යාපනේ කච්චේරියේදීය.

පී. ජේ. හඩ්සන්,
ආණ්ඩුවේ ඒජන්ත වර්‍යා.

ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—ඩිස්පැන්සරියක් සහ එහි භාර දොස්තර මහතාගේ නිවාසය පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරන පිණිස "203 පරිච්ඡේදයේ ඉඩම් ලබාගැනීමේ ආඥා පත්‍රයේ" පස්වෙනි කාණ්ඩයේ කර තිබෙන පංචාර්තුවල ප්‍රකාරයට ගොවිකම් සහ ඉඩම් කටයුතු භාර ඇමතිතුමාගේ නියෝගය පරිදි උතුමාණන් වහන්සේගෙන් නියිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම නම්:—

සිතියමේ නො. A 1,555. ගම—ඉරුක්කිලම්පිඩ්ඩි.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාමකියන්නෝ. | මිනුම, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | සින්නතොඩ්ඩම් .. | අවුරුදු 34ක් පමණ වයස ඇති පොල්ගස් 97ක් සහ පැල්ගස් 14කින් යුත් පොල් ඉඩම | (1) ඒ. ඇම්. මොහමඩ් මීරාසයිබු, ඉරුක්කිලම්පිඩ්ඩි, (2) ඇස්. සාහුල් හමීඩ්, 43/1, බැන්ක්ෂෝල් වීදිය, යාපනය | 0 3 24 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හයවෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනාම තමුන්ම හෝ නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1948ක්වූ දෙසැම්බර් මස 4වෙනි දින පෙරවරු 9.30ට මන්නාරමේ කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනක් ඒවා ඇත්තාවූ තමුන්ගේ අයිතිකාමේ තොරතුරු කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1948ක්වූ නොවැම්බර් මස 3වෙනි දින
මන්නාරමේ කච්චේරියේදීය.

ආර්. ඇල්. ආර්නොල්ඩ්,
මන්නාරම් දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප ඒජන්ත වම්හ.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3යන් ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—රත්නපුර-නම්බපාන පාරේ 7වෙනි වංගුව දිගුකිරීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" 5වෙනි කාණ්ඩයේ කර තිබෙන පංචාර්තුවල ප්‍රකාරයට ගොවිකම් සහ ඉඩම් පිළිබඳ ඇමතිතුමාගෙන් නියිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම් නම්:—

සිතියමේ නො. 258. ගම—කෑඩම්පේ.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාමකියන්නෝ. | මිනුම, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 810 | ලෙඩ්ඩිබෙගොඩැල්ලේ වත්ත | .. | ආර්. ඇම්. ජයසේන බන්ඩාර, කිරිබන්ඩාර, ජයසේකර මැතිනෝ, හීංකිරිමැතිනෝ, මද්දුමැතිනෝ, සෙනෙහෙවිරත්න බන්ඩාර, අමරසේකර බන්ඩාර, අල්ලිස්හාමු, ලොකුමැතිනෝ, ඇඩි කුමාරිහාමි, සමරසිංහ බන්ඩාර, ඩෙවිඩ් බන්ඩාර, බන්ඩාර මැතිනෝ, කරුණාරත්න බන්ඩාර, වනිගසේකර බන්ඩාර, ඇල්ෆ්‍රඩ් වනිගසේකර කුමාරිහාමි, සෝමවතී බන්ඩාර | 0 0 14·3 |
| 811 | එම | .. පී. ඩබ්ලිව්. ඩී. පාර | එම .. .. .. | 0 0 16·5 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා 6වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනාම තමුන්ම හෝ නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1948ක්වූ නොවැම්බර් මස 29වෙනි දින උදේ 11.30ගේ කාලසමට රත්නපුරේ කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනක් ඒම ඇත්තාවූ තමුන්ගේ අයිතිකාමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1948ක්වූ ඔක්තෝබර් මස 28වෙනි දින
රත්නපුරේ කච්චේරියේදීය.

ඩී. ඇල්. ඩී. ලෙම්බ්සන්,
සබරගමු පලාතේ ආණ්ඩුවේ ඒජන්ත වම්හ.

---

ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—බුලත්කොහුපිටියේ සූතිකාගාරය සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරන පිණිස "ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ 203 පරිච්ඡේදයේ" 5වෙනි කාණ්ඩයේ කර තිබෙන පංචාර්තුවල ප්‍රකාරයට කෘෂිකර්ම සහ ඉඩම් පිළිබඳ ඇමතිතුමාගෙන් නියිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම් නම්:—

සිතියමේ නො. A 574. ගම—පිච්චෑගම.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාමකියන්නෝ. | මිනුම, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | පැරහැන්නෙන්වත්ත .. | පොල්ගස් 10යි, පුවක්ගස් 13යි, කෙසෙල්පඳුරු 4යි සහ කානුවක කොටසක් | බුලත්කොහුපිටියේ පදිංචි සෙව්වාජේමිගේ පොන්නා විදානේ | 0 0 28·5 |
| 2 | ඇත්ගලේවත්ත .. | කොස්ගස් 4යි, අඹගස් 2යි, රබර්ගස් 8යි, සීර වැසිකිලි 2යි, සීර ගොඩනැගිලි 5යි, ළිඳක් සහ කරත්ත පාරක්ද තිබේ | පිච්චෑගම පදිංචි දඹගස්කාරගේදරගේ බිබි ප්‍රනාන්දු, එම්ගේ මයිකල් ප්‍රනාන්දු, එම්ගේ ජේලින් ප්‍රනාන්දු, එම්ගේ සොමාවතී ප්‍රනාන්දු සහ එම්ගේ ලිලී ප්‍රනාන්දු | 1 0 27·9 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා 6වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනාම තමුන්ම හෝ නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1948ක්වූ දෙසැම්බර් මස 17වෙනි දින උදේ 9.30ට බුලත්කොහුපිටියේ සෑසි බංගලාවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒවා ඇත්තාවූ තමුන්ගේ අයිතිකාමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1948ක්වූ ඔක්තෝබර් මස 30වෙනි දින
කෑගල්ලේ කච්චේරියේදීය.

ඩී. ඇල්. වීරසිංහ,
ආණ්ඩුවේ උප ඒජන්ත වම්හ.

---

## ඉඩම් නිදහස්කිරීම පිළිබඳවූ 1942කේ අංක 61 දරණ ආඥාපණත යටතේ ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම.

වර්ෂ 1942කේ අංක 61 දරණ ඉඩම් නිදහස්කිරීමේ ආඥාපණත සම්බන්ධයෙන් ඉඩම් අත්කරගැනීමේ දැන්වීමයි.

1942කේ අංක 61 දරණ ඉඩම් නිදහස්කිරීමේ ආඥාපණතේ 2 (3) වෙනි වගන්තිය යටතේ ඉඩම් කොමසාරිස්තුමා විසින් මට දී තිබෙන බලය පිට ක්‍රියාකරන මහනුවර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප ඒජන්තතැනවූ මුකුන්දදුර සෝමසිරි පෙරේරා වන මම, ඉඩම් ලබාගැනීමේ ආඥාපණතේ 6වෙනි වගන්තිය යටතේ මේ ප්‍රසිද්ධ දැන්වීම ප්‍රකාශකරමි, එනම්:—

(1) 1942කේ අංක 61 දරණ ඉඩම් නිදහස්කිරීමේ ආඥාපණත සම්බන්ධයෙන් ඉඩම් කොමසාරිස්තුමා විසින් මීට යාබදව ඇති උප ලේඛනයෙහි විස්තරකරනලද ඉඩම් අත්කරගත යුතුයයි තීරණය කරගෙන තිබෙන බව හා ආණ්ඩුව එකී ඉඩම් අත්කර ගැනීමට අදහස්කරන බවත්;

(2) ඒ ඉඩම්වලට ඇති සියලුම අයිතිවාසිකම් වෙනුවෙන් වන්දිය ඉල්ලිය යුත්තේ මාගෙන් බවත්;

(3) ඒ ඉඩම කෙරෙහි ඇති අයිතිවාසිකම් දක්වන සැමදෙනාම තම තමන් විසින්ම හෝ නියෝජිතයකු මගින් මහනුවර කච්චේරියේදී වර්ෂ 1948ක්වූ දෙසැම්බර් මස 2වෙනි දින පෙරවරු 10ගේ කාලසමට මා ඉදිරියේ පෙනීසිට ඒ ඉඩම කෙරෙහි තම තමන්ගේ ඇති අයිතිවාසිකම්වල ස්වභාවයත් ඒ අයිතිවාසිකම්වලට වන්දි සඳහා කරන ඉල්ලීම්වල මුදල හා තොරතුරුත් කියා සිටිය යුතු බවත් මෙයින් දැනුම්දෙනු ලැබේ.

වර්ෂ 1948ක්වූ ඔක්තෝබර් මස 30වෙනි දින
මහනුවර කච්චේරියේදීය.

ඇම්. ඇස්. පෙරේරා,
මහනුවර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප ඒජන්තතුමා.

### උප ලේඛනය.

මුල් පිඹුරේ අංකය ඒ 1,338. ගම—කොවකෙත්පිටිය.

| කට්ටිය. | ඉඩමේ නම. | විස්තරය. | ඉල්ලුම්කරුගේ නම. | බිම් ප්‍රමාණය, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | ගල්බොක්කේයාය, කිරිබෙඹි පල්ලියේකුඹුර | දෙහි, කොස්, පොල් සහ කජුගස් ඇති වත්ත, හේන සහ මූකලාන | ඩබ්ලිව්. ඇම්. ඇස්. ජේ. උඩහත්තැන්න, නො. 163, කටුකැලේ, මහනුවර | 43 1 15 |
| 2 | අඹිපාර .. | .. අඹිපාර .. .. | එම .. .. | 0 0 13 |
| 3 | ඇළ .. | .. ඇළ .. .. | එම .. .. | 0 0 11 |
| 4 | මුරපොලඇළ | .. ඇළ සහ ගොඩවෙල්ල .. | එම .. .. | 3 3 12 |
| 5 | කිරිබෙඹිපල්ලියේකුඹුර, ගල්බොක්කෙයාය | හේන සහ පාළු කුඹුර සහ මූකලාන | එම .. .. | 38 3 39 |
| 6 | ඇළ .. | .. ඇළ .. .. | එම .. .. | 0 0 10 |
| 7 | ඇළ .. | .. ඇළ .. .. | එම .. .. | 0 0 11 |
| 8 | කිරිබෙඹිපල්ලියේකුඹුර, ගල්බොක්කෙයාය | හේන සහ අඹිපාර .. | එම .. .. | 20 2 21 |
| 9 | ඇළ .. | .. ඇළ .. .. | එම .. .. | 0 0 14 |
| 10 | ඇළ .. | .. ඇළ .. .. | එම .. .. | 0 0 38 |
| 11 | ගල්බොක්කෙයාය, කිරිබෙඹි පල්ලියේකුඹුර | හේන සහ පාළු කුඹුර .. | එම .. .. | 15 2 1 |

---

**වර්ෂ 1942කේ අංක 61 දරණ ඉඩම් නිදහස්කිරීමේ ආඥාපනත සම්බන්ධයෙන් ඉඩම් අත්කරගැනීමේ දැන්වීමයි.**

1942කේ අංක 61 දරණ ඉඩම් නිදහස්කිරීමේ ආඥාපනතේ 2 (3)වෙනි වගන්තිය යටතේ ඉඩම් කොමසාරිස්තුමා විසින් මට දී තිබෙන බලයපිට ක්‍රියාකරන නැගෙනහිර පලාතේ මඩකලපුව දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප ඒජන්තතැනවූ ආර්. ඩී. පී. පවිලස් වන මම ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ 6වෙනි වගන්තිය යටතේ මේ ප්‍රසිද්ධ දැන්වීම ප්‍රකාශකරමි, එනම්:—

(1) 1942කේ අංක 61 දරණ ඉඩම් නිදහස්කිරීමේ ආඥාපනත සම්බන්ධයෙන් ඉඩම් කොමසාරිස්තුමා විසින් මීට යාකොට ඇති උප ලේඛනයෙහි විස්තරකරනලද ඉඩම් අත්කරගතයුතුයයි තීරණයකරගෙන තිබෙන බව හා ආණ්ඩුව එකී ඉඩම අත්කර ගැනීමට අදහස්කරන බවත්;

(2) ඒ ඉඩමට ඇති සියළුම අයිතිවාසිකම් වෙනුවෙන් වන්දි ඉල්ලිය යුත්තේ මගෙන් බවත්;

(3) ඒ ඉඩම කෙරෙහි අයිතිවාසිකම් දක්වන සෑමදෙනාම තම තමන් විසින්ම හෝ නියෝජිතයෙකු මගින් කල්මුණේ කරවාකු පත්තුව කරවන නිලධාරීතුමාගේ කන්තෝරුවේදී වර්ෂ 1948ක්වූ දෙසැම්බර් මස 4වන දින පූ. භා. 10.30ට මා ඉදිරියේ පෙනීසිට ඒ ඉඩම කෙරෙහි තම තමන්ගේ ඇති අයිතිවාසිකම්වල ස්වභාවයත් ඒ අයිතිවාසිකම්වලට වන්දි සඳහා කරන ඉල්ලීම්වල මුදල හා තොරතුරුත් කියාසිටිය යුතු බවත් මෙයින් දැනුම්දෙනු ලැබේ.

වර්ෂ 1948ක්වූ නොවැම්බර් මස 1වෙනි දින මඩකලපුවේදීය.

ආර්. ඩී. පී. පවිලස්,
ආණ්ඩුවේ උප ඒජන්තතුමා.

### උප ලේඛනය.

මුල් පිඹුරේ අංකය A 882. ගම.—මබිබුප්පාලෙසි.

| කට්ටිය. | ඉඩමේ නම. | විස්තර. | ඉල්ලුම්කරුගේ නම. | බිම් ප්‍රමාණය, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | පුල්පුට්ටි .. | කුඹුර .. | තින්දූරුවේ 4වෙනි කොටසේ අලියාර් ලෙබ්බෙ මොහමඩ් සාහුල් හමීඩ් | 5 2 3 |

---

PRINTED AT THE CEYLON GOVERNMENT PRESS, COLOMBO.